**චීන සංවර්ධන බැංකු අරමුදල් මගින් ප්‍රමුඛතා මාර්ග ව්‍යාපෘතිය 3 ( අදියර I) - 2015**

-------------------------------------------------------------------------------------------

චීන සංවර්ධන බැංකු අරමුදල් මගින් ප්‍රමුඛතා මාර්ග ව්‍යාපෘතිය 3 (අදියර I) හි 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා චීන සංවර්ධන බැංකු සහයෝගීතාවය අතර 2014 මාර්තු 11 දින එළඹි අංක 4510201401100000245 දරන ණය පහසුකම් ගිවිසුම හා 2014 නොවැම්බර් 24 දින එළඹි අංක 4510201401100000587 දරන පහසුකම් ගිවිසුම යටතේ මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කෙරේ.

**1.2** <u>ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම,අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය</u>

ව්‍යාපෘතියේ ණය පහසුකම් ගිවිසුමට අනුව, උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. රට පුරා විහිදී ඇති මාර්ග කොටස් ප්‍රමුඛතා මත තෝරාගෙන ප්‍රතිසංස්කරණය කිරීම මගින් වැදගත් අත්‍යවශ්‍ය සේවාවලට ප්‍රවේශවීම පහසු කිරීම සහ ආර්ථික සංවර්ධන කටයුතු වලට දායක වීමෙන් රටෙහි ජාතික මහාමාර්ග පද්ධතියේ ගමනාගමනය වැඩිදියුණු කිරීම ව්‍යාපෘතියේ අරමුණ වේ. ණය පහසුකම් ගිවිසුම අනුව ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 46,184.54 කට සමාන එ.ජ.ඩො. මිලියන 357.69 ක් වූ අතර එයින් රු.මිලියන 38,736 කට සමාන එ.ජ.ඩො. මිලියන 300ක් චීන සංවර්ධන බැංකුව විසින් මූල්‍යායනය කිරීමට එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2014 සැප්තැම්බර් 09 දින ආරම්භ කළ අතර 2017 අප්‍රේල් 24 වන විට අවසන් කිරීමට නියමිතය.

**1.3** <u>මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම</u>

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමත් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.4** <u>විගණකගේ වගකීම</u>

මාගේ විගණනය මත මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැළසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන අගයන් සහ හෙළිදරව්කිරීම් වලට අදාල වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුලත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වල දී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැළසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැළකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ ඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමණාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුලත්වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීම පිණිස අවශ්‍ය යැයි සලකණු ලැබූ පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුලත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම් වලට අදාළ පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යනු ලබන වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන වල දක්වා ඇති වියදම් සතුටුදායක ලෙස සංසන්දනය කර ඇති බව.

(ඇ) ශ්‍රී ලංකා රජය සහ ණය සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් වලින් උද්ගත වූ වත්කම් හා වගකීම්, ණය යටතේ කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව,

(ඈ) ණය යටතේ කරන ලද ආපසු ගැනීම් ණය පහසුකම දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඉ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය සහ උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඊ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(උ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(ඌ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව සහ,

(එ) ණය පහසුකම් ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

**1.5 <u>තත්වාගණන විගණන මතය සඳහා පදනම</u>**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්වාගණනය කරනු ලැබේ.

**2. <u>මූල්‍ය ප්‍රකාශන</u>**

**2.1 <u>මතය</u>**

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, සහ මෙම වාර්තාවේ 2.2 ඡේදයෙන් දැක්වෙන කරුණු වලින් උද්ගතවන ගැලපීම් වලින් ඇති වන බලපෑම් හැර මාගේ මතය වනුයේ,

(අ) 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් කාලපරිච්ඡේදය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකාවේ රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, සහ

(ඈ) ණය පහසුකම් ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල බවත්ය.

**2.2** <u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.</u>

**2.2.1** <u>ගිණුම්කරණ අඩුපාඩු</u>

පහත සඳහන් නිරීක්ෂණයන් කරණු ලැබේ.

(අ) වැරදි ගිණුම්කරණ ප්‍රතිකර්ම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල පෙන්නුම් කරන වැඩ පූර්ව අත්තිකාරම් හා සිවිල් ඉදිකිරීම් වැඩ වල ණයහිමියෝ පිළිවෙලින් රු.මිලියන 826.27 ක් හා රු.මිලියන 320.96 ක් වැඩිපුර පෙන්නුම් කර තිබුණි.

(ආ) වැරදි ගිණුම්කරණ පිළිපැදීම් හේතුවෙන් සිවිල් වැඩ වල වටිනාකම හා රැඳවුම් මුදල් පිලිවෙලින් රු. මිලියන 601.72 ක් හා රු. මිලියන 96.41ක් අඩුවෙන් පෙන්නුම් කර තිබුණි.

**3.** <u>මූල්‍ය හා භෞතික කාර්ය සාධනය</u>

**3.1** <u>අරමුදල් උපයෝජනය</u>

අරමුදල් මූල්‍යයනය, අයවැය ප්‍රතිපාදනය සමාලෝචිත වර්ෂයේ අරමුදල් උපයෝජනය හා 2015 දෙසැම්බර් 31 දිනට උපයෝජනය කළ අරමුදල් පිළිබඳ වැදගත් දත්ත කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය පහසුකම් ගිවිසුමට අනුව මූල්‍යායනය කිරීමට එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ වෙන් කිරීම | උපයෝජනය කළ අරමුදල් සමාලෝචිත වර්ෂය තුල | | 2015 දෙසැම්බර් 31 දිනට | |
|---|---|---|---|---|---|---|---|
| | එ.ජ.ඩො මිලියන | රු. මිලියන | රු. මිලියන | එ.ජ.ඩො මිලියන | රු. මිලියන | එ.ජ.ඩො මිලියන | රු. මිලියන |
| චීන සංවර්ධනය සහයෝගීතා බැංකුව | 300.00 | 38,736.00 | 17,274.00 | 127.40 | 17,273.30 | 149.36 | 20,132.05 |
| ශ්‍රී ලංකා රජය | 57.69 | 7,448.54 | 2,877.60 | 21.22 | 2,877.60 | 25.73 | 3,469.13 |
| එකතුව | 357.69 | 46,184.54 | 20,151.60 | 148.62 | 20,150.90 | 175.09 | 23,601.18 |

**3.2** <u>භෞතික කාර්යසාධනය</u>

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ සැලසුමට අනුව ජාතික මාර්ග වල කිලෝමීටර් 248.34 ක් ජාතික මාර්ගවල කොටස් 12 ක් ව්‍යාපෘති කාලය තුල පුනරුත්ථාපනය කිරීමට බලාපොරොත්තු විය. ඉන් කි.මී. 8.80 ක් වූ මීගහජනඹුර - කුමාරගම මාර්ගය 2015 දෙසැම්බර් 31 දිනට සම්පූර්ණ කර තිබුණි. කෙසේවෙතත්, ප්‍රමාදවී වැඩ ආරම්භ කිරීම හා ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු නිරවුල් නොවීම හේතුවෙන් මහනුවර - යාපනය මාර්ගයේ කි.මී. 1+65 සිට කි.මී. 3+90 කොටස හා මාවනැල්ල - හෙම්මාතගම - ගම්පොල මාර්ගයේ කි.මී.

0+00 සිට කි.මී. 20+00 දක්වා කොටස ප්‍රගතිය පසුගාමී තත්ත්වයක් පෙන්නුම් කෙරිණි. ජාතික මාර්ග 9 ක කි.මී. 211.29 ක පුනරුත්ථාපන වැඩ කොටස් වල භෞතික ප්‍රගතිය 2015 දෙසැම්බර් 31 දිනට සියයට 38 සිට සියයට 89 දක්වා විවිධ පියවරවල උපනතියක් පෙන්නුම් කර තිබුණි.

**3.3** <u>කොන්ත්‍රාත්තු පරිපාලනය</u>

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මාර්ග පුනරුත්ථාපන වැඩවල විෂය පථය නිතර වෙනස්කිරීම සාමාන්‍යය පොදු ලක්ෂණයක් බවට පත්ව තිබුණි. ඒ හේතුවෙන් මුල් ඇස්තමේන්තුවේ පිරිවැයට වියහැකි වැඩිවීම හා වැඩ සම්පූර්ණ කිරීමට අතිරේක කාලයක් ලබාදීම අවදානමක් ඇතිවිය හැකි අතර එය විගණනයේදී බැහැරකළ නොහැක. තවද, ආරම්භ පියවරේදී කරනු ලබන භූමි සමීක්ෂණ කටයුතු නියමානුකූල ලෙස කර තිබුණේනම් මෙවැනි සිදුවීම් අවමකල හැකිව තිබුණි. නිරීක්ෂණය කරන ලද සිද්ධීන් පහත දැක්වේ.

I. දම්බොක්ක - කටුපිටිය මාර්ගයේ කි.මී 9.81 ක් වූ මුල් විෂය පථය වෙනස් කර තිබූ අතර මීටර් 12.5 ක් වූ මාර්ගයේ පලල මීටර් 1.70 කින් අඩුකර තිබුණි. රු. මිලියන 1.62ක පිරිවැයකට අතිරේක ඉඩම් අත්පත් කරගෙන තිබූ අතර මාර්ගයේ සිමා මායිම් සිදුකර නොතිබීම නිසා බාහිර පුද්ගලයන් ඉඩම් අනවසරයෙන් අත්පත් කර ගැනීම් සිදු වියහැකි බව දැක්විය හැකිය. අදාල මාර්ගයේ සිදුකල asphalt concrete නියදි පරීක්ෂණ 20ක Air voids ratios හා නියදි 6ක asphalt ඝනත්වය තාක්ෂණික ප්‍රමිතීන්ට අනුකූල නොවුණි.

II. වේයන්ගොඩ - රුවන්වැල්ල මාර්ගයේ කි.මී. 12+400 සිට කි.මී 17+750 කොටස් පුනරුත්ථාපන වැඩ විෂය පථය වැඩ ආරම්භකර වර්ෂයකට පසු අතිරේක බෝක්කු 18 ක් පැතිබැම් 5ක් හා පාලම් 4ක නැවත ඉදිකිරීම ඇතුලත් වනසේ වෙන්කොට ඇතිබව නිරීක්ෂණය විය.

III. මාරවිල - උඩුබැද්දාව මාර්ගයේ පුනරුත්ථාපන වැඩවල ප්‍රමාණපත් විස්තරාත්මක ඉංජිනේරු සමීක්ෂණ කිරීමකින් තොරව ආදර්ශ ජ්‍යාමිතික සැලසුම් මත සිදුකර තිබුණි. මෙහි ප්‍රතිඵලයක් ලෙස මාර්ගයේ ඝන උරහිස් පලල මීටර් 0.5කින් ඌණ තිබුණි. තවද, මාර්ග සංවර්ධන අධිකාරිය හා රේඛීය අමාත්‍යාංශයේ වෙනත් කටයුතු සඳහා වැයකල එකතුව රු. මිලියන 6.48 ක් මෙම මාර්ගයේ පුනරුත්ථාපන වැඩ ලෙස සලකා ක්‍රියාකොට තිබුණි.

(ආ) කිරිඇල්ල - නුදුරාන ඇහැලියගොඩ මාර්ගයේ විගණකවරුන් විසින් 2015 ඔක්තෝබර් මස තුල කළ ස්ථානීය පරීක්ෂණයේදී කොන්ත්‍රාත්තු පරිපාලනය පිළිබඳ පහත සඳහන් ඌනතා අනාවරණය විය.

I. කිරිඇල්ල - නැදුරන-ඇහැලියගොඩ මාර්ගයේ පුනරුත්ථාපන වැඩ වල විදුලි රැහැන් හා ජල සේවා ඉවත්කිරීමට පිලිවෙලින් රු. මිලියන 35.34 ක් හා රු. මිලියන 21.39 ක අතිරේක වැඩ 2015 දෙසැම්බර් 31 දිනට කරගෙන ගොස් තිබුණත් ඒවා සැලසුම් පියවරේදී මුල් ඇස්තමේන්තුවට ඇතුලත් කිරීමට හැකියාව තිබුණි.

II. කොන්ත්‍රාත් ගිවිසුමේ තාක්ෂණික පිරිවිතර ඡේද 113 අනුව මාර්ග පුනරුත්ථාපන කටයුතු වලදී හානියට පත්වන කොටස් වලට කොන්ත්‍රාත්කරු විසින් වන්දි ගෙවීමට ක්‍රියාකොට ඒ සඳහා වැය වු පිරිවැය සියයට 30ක පොදුකාර්ය හා ලාභාන්තිකයන් සහිතව ව්‍යාපෘතියෙන් ප්‍රතිපූරණය කර ගැනීමට කටයුතු කළයුතුය. කොන්ත්‍රාත්කරු වන්දි ගෙවීමට මුදල් ආයෝජනය කිරීම වෙනුවට ව්‍යාපෘතිය විසින් නිකුත්කළ චෙක්පත් බෙදාහැරීමට පමණක්

සම්බන්ධ වී ඇති බව නිර්ණය විය. කෙසේවෙතත්, කොන්ත්‍රාත්කරු සමාලෝචිත වර්ෂය තුල දී පොදුකාර්ය පිරිවැය හා ලාභාන්තිකය ලෙස රු. මිලියන 2.15 ක් ආපසු ලබාගෙන තිබූ නමුත් ප්‍රමාණ පත්‍රවල ඒ සඳහා රු. මිලියන 1.0 ක් පමණක් ප්‍රමාණ බිල්පත්වල වෙන්කර තිබුණි.

III. පරිසරය ආරක්ෂා කිරීම සඳහා කොන්ත්‍රාත්තු ලියකියවිලිවල අඩංගු ප්‍රතිපාදන වලින් බැහැරව කි.මී 9+875 සිට කි.මී 9+990 කොටසේ පාර දෙපසේ පහත්බිම් වලට අපද්‍රව්‍ය බැහැර කොට ස්වභාවික දියපාරවල් අවහිර කර තිබුණි. තවද, මාර්ග පුනරුත්ථාපන වැඩ කරගෙන යාමේදී රථවාහන පාලනය හා ආරක්ෂක උපක්‍රම ලෙස රථවාහන සංඥා පුවරු,තාවකාලික මාර්ග අවශ්‍යතා පුවරු හා රථවාහන පාලන උපකරණ භාවිතයට ගෙන නොමැති බව ස්ථානීය පරීක්ෂණයේදී අනාවරණය විය.

(ඇ) හිමදූව - ඕපාත-පිටබැද්දර මාර්ගයේ පුනරුත්ථාපන වැඩ සඳහා 2015 අගෝස්තු 12 සිට 2015 දෙසැම්බර් 31 දක්වා ද්‍රව්‍ය පාලන ඉංජිනේරුවකු උපදේශකවරුන් විසින් යොදවා නොමැති බව නිරීක්ෂණය විය. එමනිසා තත්ව පාලන කටයුතු සඳහා එකඟ වූ කාර්යයන් උපදේශකවරුන් විසින් සිදුකර නොතිබුණි.

(ඈ) රත්නපුර - වේවැල්වත්ත මාර්ගයේ කි.මී 0+00 සිට කි.මී 27+500 මාර්ග කොටස තාක්ෂණික ප්‍රමිතීන්ට අනුව සකස්කර නොමැතිබව උපදේශකවරුන් පවත්වාගෙන යන ලියකියවිලි ඇතුලත්ව තිබුණු අතර දුර්වල ජල ප්‍රතිකර්මය ( curing) හා මාර්ගය මතුපිට ශක්තිමත් වීමට පෙර රථවාහන ගමනාගමනයට ඉඩහැර තිබුණි. තාක්ෂණික ප්‍රමිතීන්ට අනුකූල වනලෙස හා අඩුලුහුඩුකම් මගහරවා ගැනීමට ඉක්මනින් ක්‍රියාකරන ලෙස හා රථවාහන පාලන කළමනාකරණයන් හා ආරක්ෂිත ක්‍රියාමාර්ග වැඩිදියුණු කරන ලෙස කොන්ත්‍රාත්කරුට අවස්ථා කීපයකදී උපදෙස් දී ඇතත් ඒ අනුව ක්‍රියාකර නොතිබුණි. ව්‍යාපෘතිය සැලසුම් පියවරේදී බිම් මට්ටමේ සමීක්ෂණ සිදුකර නොමැතිබව නිරීක්ෂණය වූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස මාර්ගයේ විෂය පථය කිලෝමීටර් 3කින් අඩුකර තිබුණි.

(ඉ) ඉඩම් අත්පත්කර ගැනීමේ ආරාවුල් හේතුවෙන් මහනුවර - යාපනය මාර්ගයේ පුනරුථාපන වැඩ ප්‍රමාදවී ආරම්භකර තිබුණි. තවද, රජයේ ප්‍රසම්පාදන මගපෙන්වීම් ඡේද 5.4.4(1) ට පටහැනිව සමූහ වෙන්කිරීම් හා අසම්භාව්‍ය වියදම් ඇස්තමේන්තුව ඇතුලත්ව ගණනය කිරීම නිසා අදාල මාර්ගයේ කි.මී 1.65 සිට කි.මී 3.90 කොටසේ පුනරුත්ථාපනය සඳහා වූ වැඩ පූර්ව අත්තිකාරම් රු. මිලියන 252.82කින් වැඩිපුර ගෙවා තිබුණි.

(ඊ) 2007 නොවැම්බර් මස ජාතික ප්‍රසම්පාදන ඒජන්සිය නිකුත්කල උපදේශක සේවා අත් පොතෙහි ඡේද 1.2.1 අනුව සිවිල් වැඩ සඳහා උපදේශකවරුන් තෝරාගැනීමේදී තරගකාරී ලංසුක්‍රමය අදාල කරගත යුතුය. කෙසේවෙතත් ප්‍රමුඛතා මාර්ග ව්‍යාපෘතිය-2 සේවයේ යෙදවූ උපදේශකවරුන් දෙදෙනෙකු තරගකාරී ලංසු ක්‍රමය අනුගමනය කිරීමකින් තොරව ව්‍යාපෘතිය සඳහා තෝරාගෙන තිබුණි. තවද උපදේශකවරුන්ගේ ගෙවීම් ඉහත සඳහන් ව්‍යාපෘතිය සමග වූ මුල්ගිවිසුමේ සඳහන් ව්‍යාපෘතියේ විචලනයක් ලෙස සලකා තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස ව්‍යාපෘතියේ උපදේශක ගාස්තු රු. මිලියන 95.58කින් අඩුකර දක්වා තිබුණි.

## 3.4 ඵලදායී නොවන ගනුදෙනු

හිමදූව-ඕපාත-පිටබැද්දර මාර්ග පුනරුත්ථාපන හා වැඩිදියුණු කිරීම් වලට සම්බන්ධ කොන්ත්‍රාත්කරු ඉල්ලීම් (claim) ගෙවීම් ප්‍රමාද කිරීම හේතුවෙන් රු. මිලියන 24.68ක් ගෙවීමට සිදුවනු ඇත.

**3.5** <u>මානව සම්පත් කළමනාකරණය</u>

ව්‍යාපෘතියේ කටයුතු ආරම්භවී වසර 3 කට පසුවවත් ව්‍යාපෘති මෙහෙයුම් ඒකකයේ නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂක තනතුරු 3ක් හා ජ්‍යෙෂ්ඨ ඉංජිනේරු තනතුරක් සම්පූර්ණ කිරීමට ඵලදායි ක්‍රියාමාර්ග ගෙන නොමැති බව නිරීක්ෂණය විය. ව්‍යාපෘතියේ ද්‍රව්‍ය පාලන ඉංජිනේරු තනතුරු 6ක් අනුමත ඇතත් 2015 දෙසැම්බර් 31 දිනට තිදෙනෙකු පමණක් සේවයේ යොදවා තිබුණි. ව්‍යාපෘතියේ ප්‍රධාන තනතුරු අඛණ්ඩ සම්පූර්ණ නොකිරීම ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතු බාධා රහිතව ගැනීමට බරපතල ලෙස බලපා ඇතිබව නිරීක්ෂණය විය. කෙසේවෙතත්, අනෙක් උපදේශකවරු දෙදෙනා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමත කිරීමකින් තොරව සේවයේ යොදවා තිබූ අතර දීමනා ලෙස එකතුව රු. මිලියන 1.09ක් සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණි.